ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது / MY NO: 4/1/චක්‍රලේඛ/2012
ඔබේ අංකය / உமது இல / YOUR NO:
දිනය / திகதி / DATE: 2012.12. 12

චක්‍රලේඛ අංකය:- 08/2012

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
සියලුම නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන්/සහකාර ඉඩම් කොමසාරිස්වරුන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**මැනුම් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේදී වැරදි ආකාරයේ යෙදුම් භාවිතා කිරීම නිවැරදි කිරීමට උපදෙස්**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත මැනුමක් සම්බන්ධයෙන් ඉල්ලීමක් කිරීමේදී ඒ සඳහා "මැනුම් නියෝගය" යන වචනය භාවිතා කෙරේ. එහෙත් එය "SURVEY REQUISITION" යන්නේ අර්ථය වැරදි ආකාරයට පරිවර්තනය කිරීම නිසා සිදු වූවක් බවත්,එහි නිවැරදි තේරුම "මැනුම් ඉල්ලීම" බවත්, සර්වේයර් ජනරාල් විසින් පෙන්වා දී ඇත. රජයේ ඉඩම් පිළිබඳ ඉඩම් කාර්ය සංග්‍රහයේ සිංහල පරිවර්තනයේද එය "මැනුම් ඉල්ලීම" ලෙස සඳහන් වේ.

එබැවින් මින් ඉදිරියට යම් මැනුමක් පිළිබඳව මැනුම් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේදී "මැනුම්නියෝගය"ලෙසින් භාවිතා නොකරන ලෙසත්,එය ඉංග්‍රීසියෙන් "SURVEY REQUISITION" ලෙස හෝ සිංහලෙන් "මැනුම් ඉල්ලීම" ලෙස භාවිතා කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ආර්.පී.ආර්.රාජපක්ෂ.
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:- 01. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්.
02.සර්වේයර් ජනරාල්,සර්වේයර් ජනරාල් දෙපාර්තමේන්තුව.
03.ඉඩම් කොමසාරිස්(ඉඩම්)/සංවර්ධන/මුදල්,
04. ලේඛන භාර කළමණාකරන සහකාර ,ලේඛනාගාරය.